**ශ්‍රී ලංකා වරාය අධිකාරිය සහ එහි පරිපාලිත සමාගම්- 2020**

-----------------------------------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 වියාචනය කළ මතය

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන "අධිකාරිය" සහ අධිකාරියේ හා එහි පරිපාලිත සමාගම්හි "සමූහය" ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මතය වියාචනය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

### 1.2 වියාචනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය වියාචනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ වියාචනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අධිකාරිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ වගකීම වේ. කෙසේ වුවද, මතය වියාචනය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 8හි 19 (b),22 , 23, 28හා 29ඡේද අනුව ස්වෙච්ඡාවෙන් ගිණුම්කරණ ප්‍රතිපත්තියක් වෙනස් කිරීමේදී අතීතයට බලපාන ආකාරයට එම වෙනස් කිරීම සිදු කල යුතුය .අධිකාරිය විසින් ජාත්‍යාන්තර වරාය සමූහ සමාගමේ (ලයිස්තුගත නොකල) ආයෝජන ඇගයීමේදී සාධාරණ අගය ලෙස 2019 වර්ෂයේදී ආයෝජන පිරිවැය රු.මිලියන 26,460 සැලකිල්ලට ගෙන තිබූ නමුත් 2020 වර්ෂයේදී එම ආයෝජනය අගය කිරීමට ආයෝජන පිරිවැය වෙනුවට සාධාරණ අගය ලෙස කොටසක ශුද්ධ වත්කම් අගය පදනම් කරගෙන රු.මිලියන 31,789 කට ඇගයීම කර තිබුණි .මෙම වත්කම ඇගයීමේ පදනම ඇතුළත් ගිණුම්කරණ ප්‍රතිපත්තිය අතීතයට බලපාන ආකාරයට වෙනස් නොකිරීම හේතුවෙන් ඇතිවූ ලාභය ලෙස රු.මිලියන 5,328 ක් සම්පූර්ණයෙන්ම වර්ෂයේ වෙනත් විස්තීරණ ආදායමට ඇතුළත් කර තිබුණි. එහෙත් ප්‍රමිතය පරිදි අතීතයට බලපාන ආකාරයට ගලපන ලද්දේ නම් වර්ෂයේ වෙනත් විස්තීරණ ආදායම යටතට ඇතුළත් කලයුතු ප්‍රමාණය රු.මිලියන 415 පමණක් බවද ඉතිරි | එකඟ නොවේ.<br>මෙහිදී 2019 සහ 2020 වර්ෂ වලදී එකම ගිණුම් ප්‍රතිපත්තිය භාවිතා කර ඇති අතර ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත වලට අනුව සාධාරණ අගය ලබා ගැනීමට යොදාගත් ක්‍රමවේදයෙහි වෙනසක් පමණක් 2020 වර්ෂයේදී සිදු කරන ලදී.<br>එම නිසා අතීතානුයෝගීව ගැලපීමේ අවශ්‍යතාවයක් නොමැති බැවින් රු.4,912,369,926 ක අධිගණනය වීමක් 2020 වර්ෂයේ දී සිදුවී නොමැත. ඩොලර් ගැනුම් මිලට මූල්‍ය වත්කම් අගය කිරීම 2021 වර්ෂයේ සිට ගිණුම් තුල සිදු කිරීමට කටයුතු කරනු ලැබේ.<br>අපගේ ගිණුම් සකස් කරන අවස්ථාවේ හම්බන්තොට ජාත්‍යාන්තර වරාය සමූහ සමාගමේ (HIPG) හි 2020 වර්ෂයේ ගිණුම් ලැබී නොතිබුණි. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 8 ප්‍රකාරව ස්වෙච්ඡාවෙන් ගිණුම්කරණ ප්‍රතිපත්තියක් වෙනස් කිරීමේදී අතීතයට බලපාන ආකාරයට එම වෙනස් කිරීම සිදු කල යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | රු.මිලියන 4,912 න් රු.මිලියන 4,306 ක් පෙර වර්ෂයේ වෙනත් විස්තීරණ ආදායමට ගැලපිය යුතු බවද නිරීක්ෂණය විය. තවද, එක්සත් ජනපද ඩොලර් මගින් සිදුකර තිබූ මෙම ආයෝජනයෙහි විදේශ විනිමය අගය ශ්‍රී ලංකා රුපියල් අගයට පර්වර්තනය කිරීමේදී ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 21 හි 23 (අ) ඡේදය ප්‍රකාරව 2020දෙසැම්බර් 31 දිනට පැවති එක්සත් ජනපද ඩොලර් ගැනුම් මිල හෝ සාමාන්‍ය අගය වෙනුවට එදින පැවති එක්සත් ජනපද ඩොලර් විකුණුම් මිල පදනම් කර ගැනීම හේතුවෙන් රු.මිලියන 605 කින් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය වත්කම්වල අගය සහ වෙනත් විස්තීරණ ආදායම් අධිගණනය වී තිබුණි. මේ අනුව මෙම ගනුදෙනුවට අදාලව වර්ෂයේ සමස්ථ විස්තීර්ණ ආදායම රු.මිලියන 4,911 කින් අධිගණනයවී තිබුණි .තවද ,ඉහත සමාගමෙහි 2020 දෙසැම්බර් 31 දිනට ආයෝජන ඇගයීම සඳහා මූල්‍ය වත්කම්වල අගය ගණනය කිරීමේදී 2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන භාවිතාකර තිබුණි. | | |
| (ආ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 හි 51වන ඡේදය අනුව ස්ථාවර වත්කම්වල ඵලදායී ජීවකාලය හා සුන්බුන් අගය වාර්ෂිකව සමාලෝචනය කර වෙනසක් සිදු වන්නේ නම් එම වෙනස ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 8 ප්‍රකාරව ගිණුම්වලට ගැලපුම් කළ යුතු වුවත් 2020 දෙසැම්බර් 31දිනට අධිකාරියෙහි ගාල්ල වරාය සතුව පැවති ධාරණ අගය රු. මිලියන 4,515 ක් වූ වර්ග 11 කට අයත් වත්කම් සමාලෝචනයට භාජනය කර නොතිබුණි. | රටේ පැවති කොවිඩ් වසංගතය නිසා මෙහි යම්කිසි ප්‍රමාදයක් සිදුවී ඇත. ඉදිරියේදී ගිණුම්කරණ ප්‍රමිත අංක 16 ට අනුව මෙම කටයුතු සිදු කරනු ලැබේ. | වත්කම් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (ඇ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 හි 55 වන වගන්තිය අනුව මෙහෙයුම් කටයුතු සඳහා භාවිතයට සුදුසු තත්ත්වයට පත්වූ අවස්ථාවේ සිට දේපළ, පිරියත හා උපකරණ ක්ෂය කිරීම සිදු කල යුතුය. එහෙත් 2019 දෙසැම්බර් 23 දින අධිකාරිය වෙත ලැබී මෙහෙයුම් කටයුතු සඳහා යොදාගෙන | මෙය විදේශීය මිලදී ගැනීමක් වේ. මිලදී ගැනීමේ ක්‍රියාවලිය මේ දක්වා අවසන් නොමැති අතර සැපයුම්කරු ඉන්වොයිසිය මේ වනතෙක් ලබාදීමට කටයුතු කර නොමැත. | වත්කම සම්බන්ධ පාලනය හා වගකීම් අධිකාරිය වෙත ලැබී ඇති නිසා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | තිබුණු රු.මිලියන 468.41 ක් වූ දියත් යාත්‍රා දෙකෙහි වටිනාකම ප්‍රාග්ධනිත කිරීම සහ අදාළ පරිදි ක්ෂය කිරීම සිදුකර නොතිබූ අතර, 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වත්කම් යටතේ විදේශ මිලදී ගැනීම් සඳහා අත්තිකාරම් ලෙස දක්වා තිබුණි. මේ අනුව දේපළ, පිරියත හා උපකරණ ඉහත ප්‍රමාණයෙන් ඌන ගණනය වී තිබුණි.<br>තවද, විදේශ මිලදී ගැනීම් සඳහා අත්තිකාරම් ගිණුමේ රු.මිලියන1,546.89 ක් වූ ඉතිරි ශේෂය තුළද, දැනටමත් ලැබී ඇති නමුත් ප්‍රාග්ධනිත නොකළ වත්කම් හා වියදම්, හඳුනානොගත් අත්තිකාරම් ලෙස දීර්ඝ කාලීනව පවත්වාගෙන යන බව නිරීක්ෂණය විය. | | |
| (ඇ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 21 හි 23 (අ) වගන්තියට පටහැනිව, 2020 දෙසැම්බර් 31 දිනට අධිකාරිය සතුව පැවති එ.ජනපද ඩොලර් මිලියන 244.5 ක් වූ ස්ථාවර තැන්පතු වටිනාකම මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ඉදිරිපත් කිරීම සඳහා ශ්‍රී ලංකා රුපියල් අගයට පරිවර්තනය කිරීමේදී පරිවර්තිත දිනයේ පැවැති එක්සත් ජනපද ඩොලර් ගැනුම් මිල වෙනුවට විකුණුම් මිල පදනම් කරගැනීම හේතුවෙන් ස්ථාවර තැන්පතු වටිනාකම සහ විදේශ විනිමය ලාභය රු.මිලියන 1,237.5 කින් අධිගණනය වී තිබුණි. | එකඟ වේ.<br>ස්ථාවර තැන්පතු වටිනාකම පරිවර්තනය කිරීම ඉදිරියේ දී ගැනුම් මිලට සිදු කිරීමට කටයුතු කරනු ලැබේ. | විදේශ විනිමය පරිවර්තනය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 21 ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (ඉ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 24 හි 19 ,18හා 21වගන්ති අනුව මූල්‍ය වර්ෂයට අදාලව සම්බන්ධිත පාර්ශවයන් සමඟ පැවති ගනුදෙනුවලට අදාලව ඒවායෙහි ස්වරූපය ,ශේෂයන් සහ මූල්‍ය ප්‍රකාශන වලට සිදුවී ඇති බලපෑම පිළිබඳව පරිශීලකයන්ට තේරුම් ගැනීමට හැකිවන තොරතුරු සම්බන්ධිත පාර්ශව ගණුදෙනු යටතේ හෙළිදරව් කලයුතු වේ. එසේ වුවද, අධිකාරිය විසින් හම්බන්තොට වරායේ වත්කම් දිගුකාලීන බදු පදනම මත පැවරීම වෙනුවෙන්, හම්බන්තොට ජාත්‍යන්තර වරාය සේවා (HIPS) සමාගමෙන් හා | ගිණුම් සටහන් අංක 63 මගින් සම්බන්ධිත පාර්ශව සමග වර්ෂය තුල සිදු කරන ලද ගණුදෙනු වලට සම්බන්ධ හෙළිදරව් කිරීම් කර ඇත. | ප්‍රමිතය ප්‍රකාරව සම්බන්ධිත පාර්ශවයන් සමඟ පැවති සියළු ගනුදෙනුවලට අදාල තොරතුරු මූල්‍ය ප්‍රකශන වල සටහන් මගින් හෙළිදරව් කිරීමට කටයුතු කල යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | හම්බන්තොට ජාත්‍යාන්තර වරාය සමූහ (HIPG) සමාගමෙන් ලැබී තිබූ රු. මිලියන 164,339 ක් වූ විලම්භිත බදු කුලී ශේෂ පිළිබඳව සහ සමාලෝචිත වර්ෂයේ ශුද්ධ ලාභය ගණනය කිරීමේදී ආදායම් ප්‍රකාශයට බැර කර තිබූ ඉහත ශේෂවලට අදාළ වාර්ෂික විලම්භිත බදුකුලී ආදායම රු.මිලියන 1,713 ක එම විලම්භිත බදු කුලී වටිනාකම හා නව තෙල් ටැංකියක් ඉදිකිරීමට වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ගෙවීම සඳහා ජයා කන්ටේනර් ටර්මිනල් සමාගමෙන් 2020 වර්ෂයේදී අධිකාරියට රු. මිලියන 42.14 ක් ලබාදීම යන සම්බන්ධිත පාර්ශවයන් සමඟ සිදුකල ගනුදෙනු වලට අදාල තොරතුරු මූල්‍ය ප්‍රකාශන සඳහා වූ සටහන් මගින් හෙළිදරව් කර නොතිබුණි. | | |
| (ඊ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 37 හි 85ඡේදය අනුව එක් එක් ප්‍රතිපාදනය සඳහා අදාළ බැදීම් ස්වරූපය පිළිබඳව කෙටි විස්තරයක් ,ගෙවීමට සිදුවන කාල වකවානු හා අවිනිශ්චිතභාවයන් පිළිබඳව හෙළිදරව් කලයුතු වුවත් අධිකාරියෙහි 2020දෙසැම්බර් 31 දිනට පැවති රු.මිලියන7,822 ක හිමිකම් පෑ හැකි වෙන්කිරීම් සම්බන්ධයෙන් ඉහත පරිදි කටයුතු කර නොතිබුණි. | එකඟ වේ. 2021.12.31 දිනට නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | ප්‍රමිතය ප්‍රකාරව එක් එක් ප්‍රතිපාදනය සඳහා අදාළ බැදීම් ස්වරූපය පිළිබඳව කෙටි විස්තරයක් , ගෙවීමට සිදුවන කාල වකවානු හා අවිනිශ්චිතභාවයන් පිළිබඳව හෙළිදරව් කිරීමට කටයුතු කල යුතු වීම. |
| (උ) | 2017 නොවැම්බර් සිට මෙහෙයුම් කටයුතු නතර කර තිබූ අධිකාරියේ පරිපාලිත සමාගමක් වන මාගම්පුර වරාය කළමනාකරණ සේවා (පුද්ගලික) සමාගම විසින් 2014 වර්ෂයේදී පුද්ගලික බැංකුවකින් ඇ.ඩො. මිලියන 24 ක ණය මුදලක් ලබාගෙන තිබුණි. එයින් ඇ.ඩො. මිලියන 22.3ක් මෙම වාර්තාවේ දින වන විටත් පියවා නොතිබූ අතර ණය පියවීම සඳහා සමාගම සතුව ප්‍රමාණවත් වත්කම් නොමැති බවද නිරීක්ෂණය විය. කෙසේ වුවද අදාළ බැංකුව විසින් මෙම ණය අයකර ගැනීම සඳහා පරිපාලිත සමාගමට හා අධිකාරියට විරුද්ධව නඩු දෙකක් 2020 වර්ෂයේදී කොළඹ දිසා අධිකරණයේ පවරා තිබුණි. එසේ වුවද, ණය මුදල සඳහා ඇපකරු වශයෙන් සහ මව් සමාගම වශයෙන් ශ්‍රී ලංකා වරාය | මේ සම්බන්ධයෙන් හැටන් නැෂනල් බැංකුව මගින් පවරන ලද නඩුවට අදාලව අධිකාරියේ කරුණු ගොනු කිරීම නීතිපති දෙපාර්තමේන්තුව මගින් සිදු කළ අතර එම කරුණු දැක්වීමට අනුව මෙම නඩුව වරාය අධිකාරියට වාසිදායක වන බැවින් මේ සඳහා අසම්භාව්‍ය බැරකම් වෙන්කිරීමක් සිදු නොකරන ලදී. | විය හැකි මූල්‍යමය අවදානම බැහැර කළ නොහැකි නිසා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව වෙන් කිරීම් සිදු කළ යුතු වීම. |

අධිකාරිය විසින් මේ සඳහා අසම්භාව්‍ය බැරකම් වෙන්කිරිමක් සිදුකර නොතිබුණු අතර නඩු පැවරීම පිළිබඳව මූල්‍ය ප්‍රකාශ සඳහා වූ සටහන් මගින් හෝ හෙළිදරව් කර නොතිබුණි.

### 1.5.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශන සඳහා වූ සටහන් අංක 2.2.2 අනුව ආශ්‍රිත සමාගම් ආයෝජන, ස්කන්ධ ක්‍රමය මත පදනම්ව අගය කරනු ලබන බව දක්වා තිබුණි. ඉහත ප්‍රතිපත්තියට අනුව අධිකාරියෙහි ආශ්‍රිත සමාගමක් වන හම්බන්තොට ජාත්‍යන්තර වරාය සේවා සමාගමෙහි (HIPS), 2020 වර්ෂය සඳහා වූ අලාභයෙන් අධිකාරිය සතු කොටස්වලට අදාල රු. මිලියන 433. 97 ක අලාභය ආශ්‍රිත සමාගමේ 2020 කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශ මත පදනම්ව ගණනය කර තිබුණි. | එකඟ වේ.<br>අවසන් ගිණුම් පිළියෙල කරන අවස්ථාවේදී හම්බන්තොට ජාත්‍යන්තර වරාය සේවා සමාගමේ (HIPS) හි විගණනය කරන ලද ගිණුම් අප වෙත ලැබී නොතිබුණි. | විගණිත මූල්‍ය ප්‍රකාශන මත පදනම්ව අදාල ගණනය කිරීම සිදුකල යුතුවීම.. |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 දෙසැම්බර් 31 දිනට වත්කම් සමාලෝචන කමිටුව විසින් හෙළිදරව් කරගෙන තිබූ කරුණු අනුව, 2020 දෙසැම්බර් 31 දිනට ධාරණ අගය රු.මිලියන 171.12 ක්වූ මෙහෙයුම් ගොඩනැගිලි හා ඉදිකිරීම් භෞතිකව හඳුනාගැනීමට නොහැකිවීම නිසා එම වත්කම්වල පැවැත්ම අවිනිශ්චිත බව නිරීක්ෂණය විය. | එකඟ වේ.<br>වත්කම් සමාලෝචන කමිටුව මගින් ලැබෙන තීරණයන් මත ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කලීන කිරීමට කටයුතු කරනු ලැබේ. | භෞතිකව හඳුනාගැනීමට නොහැකි වත්කම් නිශ්චය කර එම වත්කම් වල ධාරණ අගය ගිණුම් වලින් ඉවත් කිරීමට කටයුතු කල යුතු වීම. |
| (ආ) | ගාලු මුවදොර පිටියෙහි නවීකරණ කටයුත්තක් වෙනුවෙන් අධිකාරිය විසින් 2018 වර්ෂයේදී වැය කර තිබූ රු. මිලියන7 .61 ක මුදල ආශ්‍රිත සමාගමක්වූ ශ්‍රී ලංකා වරාය කළමනාකරණ හා උපදේශන සමාගමෙන් ලැබිය යුතු මුදලක් ලෙස අධිකාරියෙහි මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණ ද අදාල සමාගමෙහි මූල්‍ය ප්‍රකාශනයන්හි අධිකාරියට ගෙවිය යුතු මුදලක් ලෙස දක්වා නොතිබුණු අතර ඉහත මුදල ගෙවිය නොහැකි බවද සමාගම විසින් අධිකාරිය වෙත ලිඛිතව | එකඟ නොවේ.<br>මෙම මුදල ලබා ගැනීම සඳහා දිගින් දිගටම සාකච්ඡා පවත්වන ලදී. අධිකාරිය සමග මූල්‍ය ගණුදෙනු රාශියක් වසරක් තුල සමාගම විසින් සිදු කරන අතර මෙම මුදල අය කර ගැනීමට කටයුතු කල හැකි බැවින් හානිකරණ වෙන් කිරීමක් සිදු කිරීමේ අවශ්‍යතාවයක් පැන නොනගී. | ලැබිය යුතු ශේෂයන් අයකර ගැනීම හෝ හානිකරණ සඳහා වෙන් කිරීම් සිදු කළ යුතු බව. |

| | | | |
|---|---|---|---|
| | දන්වා තිබිණි .මේ හේතුවෙන් ඉහත මුදල ලැබීම අවිනිශ්චිත තත්වයක පැවැති නමුත් මූල්‍ය ප්‍රකාශනවල ඒ සඳහා හානිකරණ වෙන් කිරිමක් සිදුකර නොතිබුණි. | | |
| (ඇ) | ඔලුවිල් වරාය ව්‍යාපෘතිය සඳහා ඉඩම් අත්පත් කරගැනීම නිසා ඉඩම් අහිමිවූවන්ට වන්දි ගෙවීම සඳහා 2019 වර්ෂයේදී රු.මිලියන 41.8 ක් අඩ්ඩාලච්චේන ප්‍රාදේශීය ලේකම් වෙත ලබාදී තිබුණ ද 2021 අප්‍රේල් 30 දින වන විටත් අදාල වියදම් පිළිබඳ වාර්තාවක් අධිකාරිය වෙත ඉදිරිපත්කර නොතිබුණි .කෙසේ වුවද, ඔලුවිල් වරායෙහි මෙහෙයුම් කටයුතු අධිකාරිය යටතේ සිදු කිරීමට මෙම වාර්තාවේ දිනය දක්වා තීරණය කර නොතිබුණි. මේ හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල, ඉඩම් නිශ්කාෂණ ගිණුමේ ශේෂය තුල ඉදිරියට ගෙන එමින් පැවති ඉහත මුදල, ප්‍රාග්ධනිත කිරීම අවිනිශ්චිත වන බව නිරීක්ෂණය විය. | ඔලුවිල් වරාය ව්‍යාපෘතිය සඳහා අත්පත්කරගත් ඉඩම් වෙනුවෙන් ගෙවීම් සඳහා අඩ්ඩාලච්චේන ප්‍රාදේශීය ලේකම් වෙත මුදල් ලබාදී ඇත. එම වන්දි ගෙවීම් පිළිබඳ වාර්තාවක් මෙතෙක් වරාය අධිකාරිය වෙත ලබා දී නොමැති බැවින් අදාළ වාර්තාව ලබාදෙන ලෙස අදාල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත දන්වා යවා ඇත.<br>ඉඩම් නිෂ්කාශන ගිණුමේ පවතින රු. 41,852,082 ක මුදල ප්‍රාග්ධනිත කිරීමට අවශ්‍ය තොරතුරු ලැබීමෙන් පසු අදාල වත්කම ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කරනු ලැබේ. | වන්දි ගෙවීම් පිළිබඳ වාර්තාවක් ලබාගෙන ඉඩම් නිශ්කාෂණ ගිණුමේ ඇතුලත් වටිනාකම විධිමත් පරිදි ගිණුම්ගත කිරීමට කටයුතු කල යුතු බව. |
| (ඇ) | 2020 දෙසැම්බර් 31 දිනට අධිකාරිය විසින් සේවක මණ්ඩලය වෙත සුභසාධන පදනම මත බස් රථ කුළියට ලබාදීමේදී අයකර තිබුණු අත්තිකාරම් මුදල්වලින් අදාල ගමන අවසන්වූ පසු නිරවුල් කර ආදායමට හඳුනානොගත් ප්‍රමාණය රු.මිලියන 25.83 ක් වී තිබුණි. මේ හේතුවෙන් අධිකාරියේ ශුද්ධ ලාභය එම ප්‍රමාණයෙන් ඌන ගණනය වී තිබුණි. | අදාළ මුදල් ආදායම් ගිණුමට මාරු කිරීමට කටයුතු කරනු ලැබේ. | අදාළ සේවාව සපයා අවසන්වී ඇති නිසා ලබා ගත් අත්තිකාරම් මුදල් අධිකාරියේ ආදායමට හඳුනා ගැනීමට කටයුතු කල යුතු බව. |

## 1.5.4 එකඟතාවයක් නොමැතිව ගිණුම්වලින් ඉවත් කිරිම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| හම්බන්තොට වරාය ඉදිකිරීම සඳහා ලබාගෙන තිබූ විදේශ ණයවලින් 2017 නොවැම්බර් 30 දිනට අධිකාරියේ ගිණුම්වල ඉතිරිව පැවති රු. මිලියන 147,746 ක් වූ ණය හා පොළී ශේෂය මහා භාණ්ඩාගාරයේ එකඟතාවකින් හෝ කැබිනට් මණ්ඩල අනුමැතියකින් තොරව අධිකාරිය විසින් මූල්‍ය | එකඟ වේ.<br>සඳහන් කර ඇති මූල්‍යමය අගයන් සමග එකඟ වේ.<br>ණය මුදල් අධිකාරියේ පොත් වලින් ඉවත් කර ඇත්තේ ඒ සඳහා ණය මුදල් භාණ්ඩාගාරය වෙත ගෙවා අවසන් කිරීමෙන් පසුව වේ. | අදාල කරුණු පිළිබඳව මහා භාණ්ඩාගාරය සමග සාකච්ඡා කර අවසන් එකගතාවයකට පැමිණීමට කටයුතු කළ යුතු බව. |

| | | |
|---|---|---|
| ප්‍රකාශනවලින් ඉවත් කර තිබු අතර ඒ හේතුවෙන් එදිනෙන් පසු රජයේ කිසිදු ගිණුමක එම ණය මුදල් ඇතුලත්ව නොතිබුණි. කෙසේ වුවද අංක MPS/SEC/2017/32 හා 2017 ජූලි 20 දිනැති ''හම්බන්තොට වරාය සහන ගිවිසුම'' නම් වූ අමාත්‍ය මණ්ඩල සංදේශයට 2017 අගෝස්තු 04 දින ලබා දී තිබූ අමාත්‍ය මණ්ඩල අනුමැතිය අනුව ඉහත ණය හා පොළී ආපසු ගෙවීමේ වගකීම මහා භාණ්ඩාගාරය සතුවේ. ඒ අනුව මහා භාණ්ඩාගාරයේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුව විසින් 2017 වර්ෂයේ සිට ණය වාරික හා පොළී ගෙවා තිබූ අතර ලේඛන අනුව, 2020 දෙසැම්බර් 31 දිනට තවදුරටත් ගෙවිය යුතු ණය ශේෂය රු.මිලියන 169,566 ක් වී තිබුණි. තවද, ඉහත ණය මුදලට අදාලව 2017 නොවැම්බර් 30 දක්වා කාලයට ගණනය කරන ලද විදේශ විනිමය පරිවර්තන සමුච්චිත අලාභය රු.මිලියන 31,545 ක්ද ණය ඉවත් කිරීමත් සමඟ අධිකාරියේ ගිණුම්වලින් ඉවත් කර තිබුණි. 2017 නොවැම්බර් 30 දින සිට 2020 දෙසැම්බර් 31 දක්වා වූ විදේශ විනිමය පරිවර්තන සමුච්චිත අලාභය වූ රු.මිලියන 34,072 ක් ද ඇතුළත් 2020 දෙසැම්බර් 31 දිනට, විදේශ විනිමය පරිවර්තන සමුච්චිත අලාභය රු. මිලියන 65,618 ක් ද මහා භාණ්ඩාගාරයේ හෝ අධිකාරියේ ගිණුම්වල ඇතුළත් කර නොතිබුණි. | අධිකාරියේ පොත් වල සටහන් වී තිබුණු ණය මුදල රු. 147,746,246,365.57 වන අතර ඒ සඳහා රු. 149,943,332,000.00 ක මුදලක් භාණ්ඩාගාරය වෙත ගෙවා ඇත. | |

**1.5.5 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා**

---------------------------------------------

| විගණන නිරීක්ෂණය<br>------------------------ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම<br>-------------------- | නිර්දේශය<br>--------------- |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශන අනුව තොග ගිණුමේ ශේෂය රු.මිලියන. 2,703.55 ක් වූ නමුත් අනුරූපී වාර්තා අනුව වටිනාකම රු.මි.2,772 .55 ක් වූයෙන් රු.මිලියන 69.00 ක වෙනසක් නිරීක්ෂණය විය | තොග ගිණුමෙහි ශේෂය හා ලෙජර් කාඩ්පත්වල ඇති ශේෂයන්හි වෙනසට හේතුව පරිගණක පද්ධතියේ ඇති දෝෂයක් වන අතර එය මුදල් කොට්ඨාශය හා සැපයුම් කොට්ඨාශයේ ලේඛන අතර වෙනසක් වේ. එය DMS ආයතනය මගින් නිවැරදි කිරීමේ කටයුතු සිදු කෙරේ. | අංශ දෙක අතර එකම තොගයේ වටිනාකම අතර පවත්නා වෙනස හඳුනාගැනීම සඳහා සැසඳුම් ප්‍රකාශයක් සකස් කළ යුතුවීම . |

### 1.5.6 ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඒකාබද්ධ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ වත්කම් යටතේ දැක්වෙන මාගම්පුර වරාය කළමනාකරණ සමාගමේ වත්කම්වල ඇතුළත් රු.මිලියන 12.43 ක් වූ තොග, ධාරණ අගය වූ රු. මිලියන 0.62 ක් වූ ස්ථාවර වත්කම්, සහ අත ඉතිරි මුදල් රු.මිලියන 0.17 ක් භෞතිකව නොපැවතුණි. රු. මිලියන 13.22 ක් වූ මෙම පාඩු සඳහා ප්‍රතිපාදනයන් ද මූල්‍ය ප්‍රකාශනවල සිදුකර නොතිබුණි.<br>තවද, මූල්‍ය තත්ත්ව ප්‍රකාශය අනුව 2019 දෙසැම්බර් 31 දිනට එම සමාගමට රජයෙන් ලැබිය යුතු රු.මිලියන 17.78 ක ශේෂය, නැව්තෙල් රක්ෂණය වෙනුවෙන් ලැබිය යුතු රු. මිලියන 28.04 ක ශේෂය සහ වෙළඳ ණයගැතියන්ගෙන් ලැබිය යුතු රු. මිලියන 3.58 ක් වූ ශේෂ සඳහා සහ එදිනට සමාගම විසින් ගෙවිය යුතු අනිකුත් දෑ වලට අදාළ රු. මිලියන 15.59 ක ශේෂය වෙනුවෙන් මූලාශ්‍ර ලේඛන, ශේෂ සනාථන ලිපි, වයස් විශ්ලේෂණ වාර්තා සහ උපකාරක ලියවිලි විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි. | එකඟ නොවේ.<br>සමාගම ඈවර කිරීම සම්බන්ධ ලිඛිත දැන්වීමක් සිදු කර නොමැති නිසා ප්‍රතිපාදන තැබීම අවශ්‍ය නොවේ.<br>මාගම්පුර වරාය කළමනාකරණ පුද්ගලික සමාගම (MPMC) ආයතනය විසින් විගණනය සඳහා මූලාශ්‍ර ලේඛන, ශේෂ සනාථන ලිපි, වයස් විශ්ලේෂණ, උපකාරක ලියවිලි ශ්‍රී ලංකා වරාය අධිකාරිය සතුව නොමැති බැවින් එම සමාගමේ කළමනාකරිත්වය වෙතින් විමසුම් කළ යුතුවේ. | පරිපාලිත සමාගමේ සියයට සියයක කොටස් අයිතිය හිමි මව් සමාගම වශයෙන් සහ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල පරිපාලිත සමාගම් වත්කම්, වගකීම් පෙන්නුම් කරන හෙයින් ඒ පිළිබඳ අවධානය යොමු කළ යුතුවේ. |

### 1.5.7 නිරවුල් නොවූ ලැබිය යුතු දෑ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| හම්බන්තොට වරාය ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා භාණ්ඩාගාරය විසින් ලබාගත් ණය මුදල් සඳහා 2017 වර්ෂයේ දී අධිකාරිය විසින් ගෙවන ලද වාරික මුදලක් ලෙස රු. මිලියන 4,777 ක් හා මුද්දර ගාස්තු රු. මිලියන 372 ක් ද ඇතුළුව 2020 දෙසැම්බර් 31 දිනට රු. මිලියන | එකඟ වේ.<br>මෙම මුදල ආපසු ගෙවන ලෙසට දන්වා අමාත්‍යාංශ ලේකම් මගින් 2017.08.30, 2017.12.28, 2018.11.19, 2019.02.12, 2019.04.10, 2019.07.03 සහ 2019.11.15 දිනැති ලිපි මහා භාණ්ඩාගාරයේ ලේකම් | ලැබිය යුතු මුදල් නිරවුල් කර ගත යුතු වීම |

| | | |
|---|---|---|
| 5,156 ක මුදලක් මහා භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු ලෙස මූල්‍ය ප්‍රකාශන තුල දක්වා තිබුණ ද 2021 ජුලි 31 දින දක්වා එම මුදල් අධිකාරිය වෙත ලැබී නොතිබුණි. තවද, මේ සම්බන්ධයෙන් ශේෂ සනාථ අධිකාරිය විසින් කැඳවා තිබුණද මහා භාණ්ඩාගාරය විසින් එම සනාථන තහවුරු කර නොතිබුණු අතරම 2020 වර්ෂය සඳහා වූ ජනරජ මූල්‍ය ප්‍රකාශනවල ගෙවිය යුතු ශේෂය තුළ මෙම ශේෂය ඇතුලත් කර නොතිබුණු බවද නිරීක්ෂණය විය. මේ නිසා මෙම මුදල ලැබීම පිළිබඳ අවිනිශ්චිතතාවයක් පැවතුණි. | වෙත යවා ඇති අතර, ඉහත මුදල් ලබා දෙන ලෙස ඉල්ලා 2020.01.07, 2020.05.14 සහ 2021.03.24 යන දිනැති ලිපි රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත ද යවා ඇත. | |

**1.6** **ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

**1.6.1** **ලැබිය යුතු මුදල්**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 දෙසැම්බර් 31 දිනට අධිකාරියේ ණය කාලසීමාව ඉක්මවූ මුළු නැව් නියෝජිත ණයගැති ශේෂය රු.මිලියන 1,405.21 ක් විය. එය මුළු නැව් නියෝජිත ණයගැති ශේෂයෙන් සියයට 50 ක් වී තිබුණි. | එකඟ වේ. | අනුමත ණය කාල සීමාව තුළ ණයගැති ශේෂයන් අය කර ගැනීමට කටයුතු කළ යුතු බව. |
| (ආ) | 2020 දෙසැම්බර් 31 දිනට ආරවුල් සහිත ණයගැතියන් (dispute debtors) රු.මිලියන122.85 ක් සහ නැවත විසඳීම සඳහා (re-dispute) යොමු කළ ණයගැතියන් රු. මිලියන 29.42 ක් පැවතුණි. ඉහත ශේෂ තුල මාස හයක්,වර්ෂයක්,හා වර්ෂ 1 ත් 3 ත් අතර කාළ පරිච්ඡේද තුළ නොවිසඳුණු ශේෂ පිළිවෙළින් රු.මිලියන 84.04 ක්, රු. මිලියන 21.44 ක් හා රු. මිලියන 17.29 ක් වී තිබුණි. | එකඟ වේ.<br><br>\| \| **Dispute ගිණුමේ ශේෂය** \| **Re Dispute ගිණුමේ ශේෂය** \|<br>\| 2020.12.31 දිනට ශේෂය \| 122,856,461 \| 29,418,229 \|<br>\| 2021.05.18 දිනට ශේෂය \| 61,023,341 \| 5,189,531 \|<br><br>Dispute ගිණුමේ සහ Re Dispute ගිණුමේ පැවති ශේෂයන්ගෙන් මෙතෙක් නිරවුල්වී නොමැති ශේෂයන්ට අදාල විවාදිත බිල්පත් නිරවුල් කිරීමට කටයුතු කරනු ලැබේ. | පවත්නා ගැටළු නිරාකරණය කරගෙන ලැබිය යුතු දැ හැකි ඉක්මනින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

### 1.6.2 අත්තිකාරම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| නැව් නියෝජිතයින් විසින්, වරාය සේවා පහසුකම් ලබාගැනීම සඳහා ගෙවන ලද අත්තිකාරම් මුදල්වලින් සත්‍ය වියදම් පියවීමෙන් පසු, 2020 දෙසැම්බර් 31 දිනට, ඉතිරිව පැවති ශේෂය රු.මිලියන 786.97 වූ අතර එයින් රු.මිලියන 111.75 ක් සේවාව ලබාගෙන මාස 06 ඉක්මවා තිබුණු නමුත් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.<br>තවද, නියෝජිතයින් විසින් වරාය සේවා ලබාගැනීම වෙනුවෙන් ඉන්වොයිසි වටිනාකමට වඩා වැඩියෙන් ගෙවන ලද මුදල් ප්‍රමාණයන්, නැව් නියෝජිත බැර ශේෂ (shipping agent credit balances) ලෙස මූල්‍ය ප්‍රකාශවල දක්වා තිබූ අතර 2020 දෙසැම්බර් 31 දිනට එම ශේෂය රු.මිලියන 496.78 ක් ද වූ අතර , එයින් රු.මිලියන 110.75 ක් සේවාව ලබාගෙන මාස 06 කට වඩා වැඩි කාලයක් ගතවී තිබුණ ද පියවීමට කටයුතු කර නොතිබුණි. | එකඟ නොවේ.<br>ශේෂයන් නිවැරදි වේ.<br>නැව් නියෝජිතයින් විසින් ගෙවනු ලබන මුදල් ප්‍රමාණයෙහි අතිරික්තයක් ඇති අවස්ථාවලදී එය මුදලින් ආපසු ගෙවීමක් සිදු කරනු නොලැබේ. නමුත් ගිණුම් වසන අවස්ථාවේදී පමණක් මුදලින් ආපසු ගෙවීමක් සිදු කරයි. එයට අමතරව නැව් ඒජන්තවරුන් වෙත ලබා දෙනු ලබන වට්ටම් පවා අදාල ගිණුමට බැරකරනු ලබයි. එබැවින් අත්තිකාරම් නිරවුල් කිරීමේ අවශ්‍යතාවයක් පැන නොනගින අතර එය ඉදිරි ගෙවීමක් සඳහා භාවිතා කළ හැක. | සේවා ලබා ගැනීම වෙනුවෙන් අධිකාරිය වෙත ගෙවන ලද අත්තිකාරම් මුදල්වලින් අදාළ සේවාව සැපයීමෙන් පසු ඉතිරිවන අත්තිකාරම් මුදල් හා වැඩිපුර ගෙවීම් පිළිබඳ විස්තරාත්මක උපලේඛණ හා වයස් විශ්ලේෂණ , පිළිබඳ සැලකිල්ලට ගෙන කල්ගිය ශේෂ නිරවුල් කිරීමට කටයුතු කිරීම. |

### 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1971 අංක 38 දරන මුදල් පනත 11 වගන්තිය හා 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.2.2 වගන්තිය. | 2019 දෙසැම්බර් 31 දිනට පෙර අධිකාරිය විසින් ස්ථාවර සහ කෙටි කාලීන තැන්පතුවල ආයෝජනය කරන ලද රු. මිලියන 48,456 ක් සඳහා මුදල් අමාත්‍යවරයාගේ එකඟතාවය ලබා ගෙන නොතිබුණි. | එකඟ නොවේ.PED/12 දරණ ව්‍යාපාර චක්‍රලේඛය අනුව කෙටිකාලීන තැන්පතුවල කරනු ලබන ආයෝජන සඳහා මුදල් අමාත්‍යවරයාගේ එකඟතාවය ඉල්ලුම් කර ඇත. 2020 වර්ෂයේ සිදු කරන ලද තැන්පතු මුදල සඳහා මුදල් අමාත්‍යතුමාගේ එකඟතාවය ලැබී ඇත. | මුදල් පනතේ සහ චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව තැන්පතු ආයෝජන සඳහා අදාල අනුමැතිය ලබා ගත යුතු බව. |
| (ආ) | 1971 අංක 38 දරන මුදල් පනත 10 (5) වගන්තිය | රාජ්‍ය සංස්ථාවක යම් වර්ෂයක අතිරික්තයක් තිබේ නම් පනතේ දක්වා ඇති අඩු කිරීම් කළ පසු ඉතිරිය ඒකාබද්ධ | එකඟ නොවේ<br>ශ්‍රී ලංකා වරාය අධිකාරිය පනත අනුව, ශ්‍රී ලංකා වරාය අධිකාරිය පිහිටුවීමේදී රජය | අතිරික්තය සම්බන්ධයෙන් මුදල් පනතේ විධිවිධාන පරිදි කටයුතු කළ යුතුවීම. |

| | | | | |
|---|---|---|---|---|
| | | අරමුදලට බැර කළ යුතුය. එසේ වුවද 2016 සිට 2020 දක්වා වර්ෂවලදී අධිකාරිය ලබා තිබූ එකතුව රු.මිලියන 48,991 ක් වූ ශුද්ධ ලාභවලින් ඒකාබද්ධ අරමුදලට බැර කර තිබුණේ රු.මිලියන 600 ක් පමණි. තවද ඉහත ලාභ තුල දීර්ඝ කාලීන බදු පදනම මත පෞද්ගලික අංශය වෙත ලබා දී ඇති දකුණු ආසියාතික පිවිසුම් පර්යන්තය (SAGT) හා කොළඹ ජාත්‍යන්තර බහාලුම් පර්යන්තය (CICT) යන පර්යන්තවල මෙහෙයුම් කටයුතු වල නිරතව සිටින සමාගම් දෙකෙන් අධිකාරිය විසින් 2016 සිට 2020 දක්වා අයකර තිබූ එකතුව රු.මිලියන 10,615 ක් වූ බදු කුලී හා එම කාලය සඳහා රාජ්‍ය භාගය ලෙස අයකරගත් එකතුව රු. මිලියන 15,164 ක් ද ඇතුලත් වී තිබුණි. මෙම ආදායම් වරාය සෘජු මෙහෙයුම් ආදායම් නොවන බව තව දුරටත් නිරීක්ෂණය විය. | විසින් දරන ලද ප්‍රාග්ධනයෙන් (Equity Capital) 8% ක උපරිමයකට යටත්ව ලාභාංශ ලබාදිය යුතු බව සඳහන් කර ඇත. කෙසේ වුවත් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා වරාය අධිකාරියට ලාභාංශ ගෙවීමෙන් නිදහස් කර ඇති බව 2018.04.24 දිනැති ලිපිය මඟින් දැනුම් දී ඇත. ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් ජාතික වැදගත්කමකින් යුතු වරාය ව්‍යාපෘති සඳහා ලබාගත් ණය මුදල් පියවීම ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින්ම සිදුකරන බැවින් අදාල නිදහස් කිරීම සිදුකර ඇත.<br>දකුනු ආසියා පිවිසුම් පර්යන්තය (SAGT) හා කොළඹ ජාත්‍යන්තර බහළු පර්යන්තය (CICT) යන පර්යන්තවලින් ලැබුණු වාර්ෂික බදුකුලි හා රාජ්‍ය භාගය සෘජු මෙහෙයුම් ආදායම යටතේ නොව වෙනත් මෙහෙයුම් ආදායම යටතේ දක්වා ඇත. | |
| (ඇ) | 2003 ජුනි 02දිනැති අංක PED 12/ දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | | | |
| (i) | (ii) 4.2.2 සහ 5.1.2 වගන්තිය | අධිකාරියේ එක් එක් අංශයේ ක්‍රියාකාරකම් වලට අදාලව ප්‍රධාන කාර්යසාධන දර්ශකයන් (Key Performance Indicators) හඳුන්වාදී එක් එක් අංශයේ කාර්යසාධනය ඇගයීමක් සිදු කලයුතු වුවත් අධිකාරිය විසින් සමාලෝචිත වර්ෂයේදි එම අවශ්‍යතාවය ඉටුකර නොතිබුණි. | කාර්ය සාධන දර්ශක සකස් කළහැකි සියළුම කොට්ඨාශ සඳහා ඉදිරියේදී සකස් කිරීමට කටයුතු කරනු ලැබේ. | ප්‍රධාන කාර්ය සාධන දර්ශක හඳුනාගෙන කාර්ය සාධනය ඇගයීමට කටයුතු කල යුතු බව. |

| | | | | |
|---|---|---|---|---|
| (ii) | 9.3.1 වගන්තිය සහ 2013 ජනවාරි 23 දිනැති අංක DMS/F1/3/3-1 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ලිපිය | බඳවාගැනීමේ කාර්යය පටිපාටියක් සකස් කර රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගත යුතු වුවත් අධිකාරිය විසින් කෙටුම්පත් බඳවා ගැනීමේ හා උසස්කිරීමේ පටිපාටි සකස්කර තිබුණද ඒ සඳහා කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් හඳුන්වා දී ඇති මාර්ගෝපදේශවලට අනුකූලව බඳවා ගැනීමේ පටිපාටිය සැකසීමේදී ඇතිවන ගැටළු හඳුනාගැනීමෙන් අනතුරුව මේ පිළිබඳව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ නිළධාරීන් හා වරාය හා නාවික අමාත්‍යාංශයේ නිළධාරීන් සමග සාකච්ඡා පවත්වන ලදී.<br>එහිදී කළමනාකරණ සේවා චක්‍රලේඛ 2/2016 හි වැටුප් ක්‍රමය අදාළ කරගත යුතු ආයතන යටතට වරාය අධිකාරිය ඇතුලත්ව නොමැති බව පෙන්වා දෙන ලදී. එසේම සාමූහික ගිවිසුම්වලට එළඹ වසර 03 කට වරක් වැටුප් වැඩි කිරීම් සිදු කරනු ලබන ආයතන සම්බන්ධව රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් මාර්ගෝපදේශයන් සකස් කර ගෙන යන බව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් පවසා සිටින ලදී.<br>කෙසේ වෙතත්, තව දුරටත් බඳවා ගැනීමේ පටිපාටි සකස් කිරීමේ හැකියාව අධ්‍යයනය කිරීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ නිළධාරියෙකු ලබා දෙන බවත්, ඔවුන් සමග සාකච්ඡා කොට ගැටළු නිරාකරණය කර ගනිමින් බඳවා ගැනීමේ පටිපාටි සැකසීමට උත්සහ කරන ලෙසත් එහිදී වැඩි දුරටත් උපදෙස් දී ඇත. ඒ අනුව ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. | චක්‍රලේඛ විධිවිධාන පරිදි බඳවා ගැනීමේ පටිපාටියක් සකස් කර විධිමත් අනුමැතින් ලබා ගැනීමට කටයුතු කල යුතු බව |

| | | | | |
|---|---|---|---|---|
| (iii) | 2019 පෙබරවාරි 12 දිනැති අංක MPS/AD/06/83 - 2017 දරණ වරාය හා නාවික කටයුතු සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශය මගින් නිකුත් කරන ලද ලිපිය | වරාය අධිකාරියේ බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය අනුමත කර ගන්නා තෙක් අධිකාරියේ සියළු බඳවාගැනීම් හා උසස්කිරීම් නොකරන ලෙස උපදෙස් ලබා දී තිබූ නමුත් අධිකාරිය විසින් 2020 වර්ෂය තුළ පමණක් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමකින් තොරව උසස්වීම් 22ක් ලබාදී තිබුණි. | පුරප්පාඩු පිරවීමකින් තොරව අත්‍යාවශ්‍ය රාජකාරි ඉටුකර ගැනීමේ අපහසුතාවය මත අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද බඳවා ගැනීමේ පටිපාටිය අනුව 2020 වර්ෂයේදී මෙම උසස්වීම් ලබා දීම සිදු කර ඇත. | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තවේ අනුමැතිය රහිතව බඳවා ගැනීම් හා උසස්කිරීම් නොකළ යුතු බව. |
| (ඇ) | 2017 සැප්තැම්බර් 20 දිනැති ශ්‍රී ලංකා වරාය අධිකාරියේ අභ්‍යන්තර චක්‍රලේඛ අංක 2017/26 හි 6 වන ඡේදයේ I හා II වගන්ති | අධිකාරියේ නිළධාරීන්ට ලබාදෙන නිල නිවාසවල පදිංචිව සිටීමට ඉඩදෙන කාලසීමාව, පළමුව නිවාස ලබා දුන් දින සිට වසර 5 ක උපරිමයකට සීමා වන අතර, එම කාලසීමාව සම්පූර්ණවීමෙන් පසුව නිළධාරියාගේ මාසික මූලික වැටුපෙන් සියයට 12.5ක මුදලක් ද අය කරමින් නිවාස කමිටුවේ අනුමැතිය ඇතිව තවත් වසරක කාලයක් රැදීසිටීමට හැකියාව පවතී. එසේ වුවද 2020 දෙසැම්බර් 31 දිනට නිලධාරීන්ට ලබා දී තිබූ නිල නිවාස සම්බන්ධයෙන් කළ නියැදි පරීක්ෂාවට අනුව වර්ෂ 6 සිට වර්ෂ 27 දක්වා කාල පරාසයන් තුළ අදාල නිල නිවාසවලින් ඉවත් නොවී රැදී සිටින නිලධාරීන් සංඛ්‍යාව 456 ක් බව අණාවරණය විය. | අංක 2017/26 හා 2017.09.20 දිනැති නිල නිවාස සම්බන්ධයෙන් වූ චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමට නොහැකි වී ඇත. එහෙත් අංක 02/2021 හා 2021.01.30 දිනැති නිල නිවාස සම්බන්ධයෙන් වූ නව චක්‍රලේඛය අනුව නිවාස කුලිය වැඩිකර ඇති අතර වසර 05 ක් ඉක්මවූ අයවළුන් ඉවත්විය යුතු බවට කොන්දේසියක්ද ඇතුළත් කර ඇත. වසර 05 ඉක්මවා පදිංචිව සිටින සියළුම සේවකයින්ගේ (කොට්ඨාශ ප්‍රධානීන් හා ඊට ඉහළ තනතුරු හැර) නිවාස කුලිය දෙගුණයක් අය කිරීමට මේ වන විට කටයුතු කර ඇත. | සේවකයන්ට නිල නිවාස ලබා දීම සම්බන්ධව විධිමත් හා සාධාරණ ක්‍රමවේදයක් අනුගමනය කළ යුතු බව. |
| (ඉ) | 2020 නොවැම්බර් 27 දිනැති අංක මුකො/මුගි/කො/41/ 2020 දරණ 2020 ශ්‍රී ලංකා වරාය අධිකාරියේ අභ්‍යන්තර චක්‍රලේඛය 2-12 වගන්තිය | සියළුම කොට්ඨාශ හා අංශ ප්‍රධානීන් විසින් ලබාගත් අත්තිකාරම් මුදල් දෙසැම්බර් 31 දිනට පෙර නිරවුල් කළ යුතු වුවද 2020 දෙසැම්බර් 31 දිනට අවස්ථා 143 කදී එසේ ලබාගත් අත්තිකාරම් රු.මිලියන 143.44 ක් එපරිදි නිරවුල් කර නොතිබුණි. ඒ අතරින් රු.මිලියන 50.41 ක් මාස 6-12 අතර කාලයක් ද, රු. මිලියන | අත්තිකාරම් ගිණුම් ශේෂය සමග එකඟ වේ. කෙසේ වුවද 00-000-142341 දරණ අත්තිකාරම් ගිණුම මුදල් කොට්ඨාශය විසින් පවත්වා ගෙන යනු ලබන මුත් අදාළ වවුචරය ඉදිරිපත් කරන කොට්ඨාශය විසින්ම එම වවුචර්වලට අදාළ පියවීමේ කටයුතු සිදු කළ යුතු වේ. එබැවින් | භාණ්ඩ හා සේවා ලබා ගැනීමෙන් පසු කෙටි කාලයක් තුල අත්තිකාරම් මුදල් පියවීමට කටයුතු කල යුතුය. |

| | |
|---|---|
| 71.44 ක් වර්ෂ 1-2 අතර කාලයක්ද, රු.මිලියන 0.48 ක් වර්ෂ 2-5 අතර කාලයක්ද නොපියවා පැවතුණි. මෙලෙස දීර්ඝ කාලීනව අත්තිකාරම් නොපියවීමට හේතු විගණනයට අනාවරණය නොවුණි. | අත්තිකරම් මුදල් නිරවුල් නොකල කොට්ඨාශ හා අංශ දැනුවත් කරමින් කඩිනමින් මෙම ගිණුම් පියවීමට කටයුතු කරන ලෙස දන්වා ඇත. |

## 1.8 බදු රෙගුලාසිවලට අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මෙට්‍රික් ටොන් 3200 ක් ගබඩා කල හැකි නව තෙල් ටැංකියක් ඉදිකිරීම සහ තෙල් ටැංකි 10 ක් ආවරණය වන පරිදි ගිනි නිවීමේ පද්ධතියක් සවිකිරීම සඳහා එකඟවන ලද කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 20 ක් වූ රු.මිලියන 45.51 ක් කොන්ත්‍රාත්කරු වෙත ගෙවීම සඳහා ජයා කන්ටේනර් ටර්මිනල් සමාගම විසින් ශ්‍රී ලංකා වරාය අධිකාරිය වෙත සමාලෝචිත වර්ෂය තුළදී ලබා දී තිබුණු අතර අධිකාරිය විසින් එම මුදල් කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබුණි. ඉහත මුදල තුළ අන්තර්ගත රු. මිලියන 3.37 ක් වූ එකතු කළ අගය මත බදු (VAT) වටිනාකම කොන්ත්‍රාත්කරු විසින් නිකුත් කරනු ලබන බදු ඉන්වොයිසිය ලබා ගැනීමකින් තොරව ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ලිපි ශීර්ෂ යටතේ ලබා දුන් බදු ඉන්වොයිසියක් පදනම් කරගෙන සමාගම විසින් යෙදවුම් බදු ලෙස 2020 ඔක්තෝබර් මාසයේදී දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවෙන් යෙදවුම් බද්දක් ලෙස ලබා ගැනීමට කටයුතු කර තිබුණි. එසේම, ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් ද ඉහත බදු මුදලම කොන්ත්‍රාත්කරු ලබා දුන් වැට් ඉන්වොයිසිය පදනම් කරගෙන 2020 ඔක්තෝබර් සහ නොවැම්බර් මාස වලදී ගෙවිය යුතු වැට් බදු ගණනයේදී යෙදවුම් බද්දක් ලෙස අඩු කරගෙන තිබුණි. මේ අනුව ඉහත සඳහන් රු.මිලියන 3.37 ක වැට් බද්ද ආයතන දෙක විසින්ම යෙදවුම් බද්දක් ලෙස දෙවතාවක් අඩු කරගෙන ඇති බව විගණනයේදී නිරීක්ෂණය විය. | එකඟ වේ.<br>2021 වර්ෂය තුළදී නිවැරදි කර ඇත. | එක් ආයතනයක් පමණක් එකතු කළ අගය මත බදු වටිනාකම, යෙදවුම් බද්දක් ලෙස ලබා ගත යුතු බව. |

## 1.9 තොරතුරු තාක්ෂණ (IT) පොදු පාලන ක්‍රම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අධි ආරක්ෂිත කලාපයක් ලෙස නම් කර තිබෙන වරාය පරිශ්‍රයේ ආරක්ෂාව තහවුරු කර ගැනීම පිණිස 2017 හා 2018 වර්ෂවලදී ප්‍රාග්ධන අයවැය තුලින් සියළු ගේට්ටු සහ බන්ධිත ගුදම් සඳහා පිළිවෙලින් රු. මිලියන 60 ක් හා රු. මිලියන 150 ක් වැය කර CCTV කැමරා පද්ධතියක් සවි කිරීමට සැලසුම්කර තිබුණි. 2019 වර්ෂයේදිද ඒ සඳහා රු. මිලියන 150 ක් වෙන් කර තිබූ අතර 2021 මාර්තු 09 දිනැති අංක PA/MD/46 දරන අධිකාරියේ කළමනාකාර අධ්‍යක්ෂකගේ ලිපිය මඟින් CCTV කැමරා පද්ධතියක් සවි කරන බව දන්වා තිබුණද අපේක්ෂිත පරිදි මෙම කාර්යය 2021 ජූනි 17 දින වන විටත් ආරම්භ කර නොතිබුණි. මේ හේතුවෙන් අධි ආරක්ෂිත කලාපයක් වන වරාය අධිකාරියේ ආරක්ෂාව පිළිබඳ ගැටළුවකදී අවශ්‍ය තොරතුරු ලබාගැනීමට නොහැකි වීමේ අවධානම බැහැර කළ නොහැකි වේ. | වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ අංක MPS/ADM/07/02/07 දරණ 2019.03.01 දිනැති ලිපිය මගින් CCTV කැමරා පද්ධතිය මිළදී ගැනීම සඳහා වූ ප්‍රසම්පාදන ක්‍රියාවලිය අවලංගු කිරීමෙන් පසු අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව මගින් ලබා දුන් නිර්දේශයන් අනුව විශේෂඥ දැනුම සහිතව අදාළ මිලදී ගැනීමේ කටයුතු සිදු කිරීම සඳහා 2019 වර්ෂය මැද භාගයේදී එම ප්‍රසම්පාදන ක්‍රියාවලිය අළුතින් අරඹන ලදී.ඒ අනුව නව ප්‍රසම්පාදන ක්‍රියාවලියට අදාළව පහත සඳහන් පියවරයන් ගෙන ඇති අතර 2021 වර්ෂය අගභාගය වන විට අදාළ ප්‍රසම්පාදන ක්‍රියාවලිය සම්පූර්ණ කරමින් වරාය පරිශ්‍රය තුළ CCTV කැමරා පද්ධතියක් ස්ථාපිත කිරීමට සැළසුම් කර ඇත.<br>○ මේ සඳහා කැබිනට් මණ්ඩලය විසින් පත් කරන ලද ප්‍රසම්පාදන කමිටුවක් හා තාක්ෂණික ඇගයුම් කමිටුවක් 2020.06.19 වන දින පත් කර ඇත. තාක්ෂණික ඇගයුම් කමිටුව විසින් මේ වන විටත් අදාළ මූලික කටයුතු ආරම්භ කර ඇත.<br>○ 2020 වර්ෂය තුළදී මෙම මිලදී ගැනීමේ කටයුතු අවසන් කිරීමට නොහැකි නිසා 2020 වර්ෂය සඳහා රුපියල් මිලියන 20 ක් හා 2021 වර්ෂය සඳහා රුපියල් මිලියන 580 ක් වශයෙන් ප්‍රතිපාදන වෙන් කිරීමට තීරණය කරන ලදී. එම කැමරා පද්ධතිය මිලදී ගැනීමේ කටයුතු 2021 වර්ෂයේ අවසන් කාර්තුවේදී නිම කිරීමට සැලසුම් කරන ලදී.<br>○ මෙම ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය අධ්‍යයනයන්/තාක්ෂණික නියාමනයන් සිදු කිරීමට මධ්‍යම ඉංජිනේරු උපදේශන කාර්යාංශය වෙත යොමු කිරීමට කටයුතු කරන ලදී.<br>○ කෙසේවුවද, 2021.03.05 දින පැවති රැස්වීමකදී මෙම ව්‍යාපෘතිය සඳහා | ක්‍රියාකාරී සැලැස්ම තුලින් ක්‍රියාත්මක කිරීමට නියමිත වූ කාර්යයන් සැලසුම් කළ ආකාරයට ක්‍රියාත්මක කිරීම කළමනාකරණයේ වගකීම වේ. |

ආරක්‍ෂක කොට්ඨාශය යටතේ 2021 වාර්ෂික අයවැයෙන් වෙන් කරන ලද රුපියල් මිලියන 580 ක මුදල එම අයවැයෙන් ඉවත් කිරීමට තීරණය කර ඇත. එහෙත් උක්ත ව්‍යාපෘතිය මගින් ආවරණය කිරීමට සැළසුම් කළ සමස්ත වරාය පරිශ්‍රයේ අත්‍යාවශ්‍යම ස්ථාන ආවරණය වන ලෙස ප්‍රවේශ දොරටු, බන්ධිත ගුදම්, අංගන, මහා මාර්ග හා වෙනත් ප්‍රමුඛතාවය ලබා දිය යුතු ස්ථාන වෙනුවට ප්‍රධාන වරාය පිවිසුම් දොරටු පමණක් ආවරණය කිරීම සඳහා කුඩා ප්‍රමාණයන්ගේ “CCTV Camera” පද්ධති කිහිපයක් ස්ථාපනය කිරීම සඳහා රුපියල් මිලියන 0.38 ක මුදලක් 2021 සංශෝධිත අයවැය මගින් වෙන් කිරීමට කටයුතු කර ඇත.

## 2. මූල්‍ය සමාලෝචනය

---

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

---

ඉදිරිපත් කරන ලද ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමූහයේ ලාභය රු. මිලියන 18,043 ක් හා අධිකාරියේ ලාභය රු. මිලියන 18,738 ක් විය. ඉකුත් වර්ෂයේ සමූහයේ සහ අධිකාරියේ ලාභය පිළිවෙලින් රු. මිලියන 10,847 ක් සහ රු. මිලියන 11,646 ක් වුයෙන් ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමූහයේ සහ අධිකාරියේ මූල්‍ය ප්‍රතිඵල පිළිවෙලින් රු. මිලියන 7,196 කින් සහ රු. මිලියන 7,092 කින් වැඩි වී තිබුණි. අධිකාරිය විසින් පරිපාලන වියදම් යටතේ පසුගිය වර්ෂයේදී අසම්භාව්‍ය බැරකම් සඳහා රු. මිලියන 6,809 ක් වු වෙන්කිරීම්, සමාලෝචිත වර්ෂයේදී රු. මිලියන (718) ක් දක්වා රු. මිලියන 7,527 කින් අඩුවීම, විලම්භීත බදු ආදායම රු.මිලියන 1,015 ක් වීම සහ පූර්ව වර්ෂයේ රු.මි.1,358.6 ක් වූ විදේශ විනිමය පරිවර්ථන ලාභය සමාලෝචිත වර්ෂයේදී රු.මි.(1,051.7) ක් දක්වා රු.මි.2,410.3 කින් අඩුවීම ඉහත දක්වා ඇති මූල්‍ය ප්‍රතිඵලය වැඩි වීම කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

### 2.2 අධිකාරියේ ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

---

| | 2020 (රු.මිලියන) | 2019 (රු.මිලියන) | වෙනසේ ප්‍රතිශතය |
|---|---|---|---|
| ආදායම | 38,930.9 | 40,769.6 | -4.5% |
| ඍජු වියදම් | (21,945.9) | (22,385.5) | -1.9% |
| දළ ලාභය | 16,985 | 18,384.1 | -7.6% |
| වෙනත් මෙහෙයුම් ආදායම් | 11,314.4 | 11,149.8 | 1.4% |

| | | | |
|---|---|---|---|
| පරිපාලන වියදම් | (7,770.2) | (15,024.6) | -48.2% |
| මෙහෙයුම් ලාභය | 20,529.1 | 14,509 | 41.4% |
| ශුද්ධ මූල්‍ය වියදම් | 849.6 | 287.4 | 195.6% |
| විදේශ විනිමය ලාභය/(අලාභය) | (1,051.7) | 1,358.6 | -177.4% |
| බදු පෙර ශුද්ධ ලාභය | 20,327 | 16,155.2 | 25.8% |
| ඒකාබද්ධ අරමුදලට බැර කිරීම් | - | (600) | 100% |
| ආදායම් බදු | (2,603.4) | (3,485.7) | -25.3% |
| විලම්භිත බදු | 1,014.6 | (423.2) | 339.7% |
| බදු පසු ශුද්ධ ලාභය | 18,738.3 | 11,646.3 | 60.8% |

පහත සඳහන් නිරීක්‍ෂණ කරනු ලැබේ.

i. පසුගිය වර්ෂයට සාපේක්‍ෂව ආදායම රු.මිලියන 1,838.7 කින් හෙවත් සියයට 4.5 කින් අඩුවී තිබූ අතර වෙනත් මෙහෙයුම් ආදායම රු.මිලියන 164.6 කින් හෙවත් සියයට 1.48 කින් වැඩිවී තිබුණි.

ii. 2019 වර්ෂයට සාපේක්‍ෂව සමාලෝචිත වර්ෂයේ ඍජු වියදම් හා පරිපාලන වියදම් පිළිවෙලින් සියයට 1.96 කින් සහ සියයට 48 කින් අඩුවී තිබුණි.

## 2.3 අනුපාත විශ්ලේෂණය

| | | 2020 | 2019 |
|---|---|---|---|
| i. | මුළු ආදායමට මෙහෙයුම් ලාභ අනුපාතය | 50.03% | 38.92% |
| ii. | ජංගම අනුපාතය | 3.22:1 | 2.66:1 |
| iii. | ක්‍ෂණික අනුපාතය | 3.11:1 | 2.57:1 |
| iv. | ශුද්ධ ලාභ අනුපාතය | 48.13% | 28.57% |
| v. | දළ ලාභ අනුපාතය | 43.63% | 45.09% |
| vi. | එක් සේවයෙකුට සේවක මණ්ඩල පිරිවැය (රු.මිලියන) | 2.2 | 2 |
| vii. | ස්කන්ධ ප්‍රාග්ධනයට දීර්ඝකාලීන ණය | 5.39:1 | 4.59:1 |
| viii. | සේවක මණ්ඩල පිරිවැය මුළු පිරිවැයේ ප්‍රතිශතයක් ලෙස | 64.96% | 50.19% |
| ix. | ඍජු මෙහෙයුම් ශුද්ධ ලාභය ආදායමේ ප්‍රතිශතයක් ලෙස | 22.29% | 4.40% |

පහත සඳහන් නිරීක්‍ෂණ කරනු ලැබේ.

- මුළු ආදායමට සාපේක්‍ෂව 2019 වර්ෂයේ සියයට 38.92 ක් වූ මෙහෙයුම් ලාභය 2020 වර්ෂයේ සියයට 50.03 දක්වා වර්ධනය වී තිබූ අතර 2019 වර්ෂයේ සියයට 28.57 ක්ව පැවති ශුද්ධ ලාභ අනුපාතය 2020 වර්ෂයේදී සියයට 48.13 ක් දක්වා වැඩි වී තිබුණි.

- 2019 වර්ෂයේ ජංගම අනුපාතය හා ක්ෂණික වත්කම් අනුපාතය පිළිවෙලින් 2.66:1 හා 2.57:1 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට එය පිළිවෙලින් 3.22:1 ක් හා 3.11:1 ක් දක්වා ක්‍රමයෙන් වැඩිවී තිබුණි.

- සෘජු මෙහෙයුම් ශුද්ධ ලාභය ආදායමේ ප්‍රතිශතයක් ලෙස ගත් විට 2019 වර්ෂයේ සියයට 4.40 ක් වූ අතර එය සමාලෝචිත වර්ෂයේදී සියයට 22.29 දක්වා වර්ධනය වී තිබුණි.

- අධිකාරියේ සේවක මණ්ඩල පිරිවැය මුළු පිරිවැයේ ප්‍රතිශතයක් ලෙස සැලකීමේදී 2019 වර්ෂයේදී සියයට 50.19 ක් වූ අතර එය සමාලෝචිත වර්ෂය අවසන් වන විට සියයට 64.96 දක්වා වර්ධනය වී තිබුණි.

- ස්කන්ධ ප්‍රාග්ධනයට දීර්ඝකාලීන ණය අනුපාතය 2019 වර්ෂයේ 4.59:1 ක් ලෙස පැවති අතර එය සමාලෝචිත වර්ෂයේ 5.39:1 ක් ලෙස වර්ධනය වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 දෙසැම්බර් 31 දිනට අධිකාරියේ අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා සේවකයින් 1001 දෙනෙකු සේවයේ යොදවා තිබූ නමුත් අධිකාරියේ මෙහෙයුම් කටයුතු (Operations) සඳහා සෘජුවම සම්බන්ධතාවයක් දක්වන මෙහෙයුම් අංශයේ සේවකයන් 563 දෙනෙකු සඳහා පුරප්පාඩුව පැවතුණි. එසේම අධිකාරියේ මෙහෙයුම් කටයුතු වෙනුවෙන් සෘජුවම සම්බන්ධතාවයක් නොදක්වන අංශ 14 ක සේවකයින් 515 දෙනෙකුගේ අතිරික්තයක් පැවතුණි. 2020 වර්ෂය තුළදී සේවක අතිරික්තව පැවති අංශවල සේවකයින් වෙනුවෙන් රු. මිලියන 1,046 ක අතිකාල දීමනා ඇතුළුව වර්ෂය සඳහා සමස්ථ අතිකාල දීමනාව රු. මිලියන 4,941 ක් ගෙවා තිබුණි.<br>තවද,ආයතන සංග්‍රහයේ viii වන පරිච්ඡේදයේ 2 (I) වගන්තිය අනුව අතිකාල දීමනා ලබාගැනීමට ප්‍රමාණවත් පරිදි අතිකාල වැඩ නියම වශයෙන් හා සාධාරණ වශයෙන් ඉටු කර තිබේදැයි සොයාබලා වගකිව යුතු නිළධාරියෙකු විසින් සෑහීමකට පත් විය යුතුය .ඒ සඳහා නියම කළ වැඩ ප්‍රමාණය ඉටු කෙරෙන බවටත් අකාර්යව සිටින කාලයට අතිකාල දීමනා නොගෙවනු ලබන බවටත් වග බලාගැනීම පිණිස නිසි පරීක්ෂණ හා වාර්තා තබා ගැනීමේ ක්‍රමයක් | අතිකාල මුදල සමග එකඟ වේ.<br>කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අංක DMS/F1/3-1 හා 2013.01.23 දිනැති ලිපිය මගින් 2018.07.20 දිනට සේවක සංඛ්‍යාව 9990 ක් අනුමත කර ඇත. ඉදිරි පස් වසරක සංවර්ධන සැලසුම් ද සැලකිල්ලට ගෙන 2012 වර්ෂයේ නව මානව සම්පත් සැළැස්ම සකස් කර ඇත. පරිපාලනය කේන්ද්‍ර ගත කිරීම හා නව පරිගණක පද්ධතීන් හඳුන්වා දීම යන කරුණු සැලකිල්ලට ගෙන කළමනාකරණ සහකාර (ලිපිකරු) තනතුරේ අනුමත සේවක සංඛ්‍යාව 966 සිට 538 දක්වා අඩු කිරීමට කටයුතු කරන ලදී. නමුත් 2010.08.09 දිනය වන විට කළමනාකරණ සහකාර (ලිපිකරු, යතුරු ලේඛක, ලඝු ලේඛක) තනතුරේ සේවක සංඛ්‍යාව 645 ක් වේ.<br>නව පරිගණක පද්ධතීන් හා පරිපාලනය කේන්ද්‍රගත කිරීම් කටයුතු ක්‍රියාත්මක නොවීම හේතුවෙන් එක් එක් කොට්ඨාශයේ කාර්යාල කටයුතු සඳහා කළමනාකරණ සහකාරවරුන්ගේ | කාර්ය මණ්ඩලය ඵලදායිව සේවයෙහි යොදවා අතිකාල වියදම් අඩු කර ගැනීමට කටයුතු කළ යුතුය.<br>අතිකාල ලබා ගැනීමේදී කල වැඩ වාර්තා ඉදිරිපත් කිරීමට කටයුතු කල යුතුය. |

සකස් කළ යුතුය .එහෙත් ඉහත අතිකාල ගෙවීම් සම්බන්ධයෙන් කළ වැඩ වාර්තා විගණනය සඳහා ඉදිරිපත් නොවුණි.

සේවා අවශ්‍යතාවය පවතින බැවින් ඉහත සඳහන් පරිදි අතිරික්තයක් ලෙස පෙනෙන කළමනාකරණ සහකාරවරුන් සඳහා නිතිපතා ඉටුකිරීමට රාජකාරි පවතී. කළමනාකරණ සහකාර තනතුර සඳහා බඳවා ගැනීම් සිදු නොකළ බැවින් විශ්‍රාම ගන්නා ලද සේවක මහත්ම/මහත්මීන් විසින් ඉටුකළ රාජකාරි අභ්‍යන්තර විධිවිධාන සලසා ගෙන දැනට සිදු කර ගෙන යනු ලැබේ. එසේ වුවත් මෙම තනතුරේ සේවක සංඛ්‍යාව ප්‍රමාණවත් නොවන බවට කොට්ඨාශ ප්‍රධානීන් මගින් කරුණු ඉදිරිපත් වී ඇති බැවින්, ඉදිරියේදී මෙම තනතුරේ අනුමත සේවක සංඛ්‍යාව සංශෝධනය කිරීම පිළිබඳව සලකා බැලීමට සිදුවනු ඇත.

2012 වර්ෂයේ සකස් කොට 2013.01.23 දින කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් අනුමත කරන ලද සේවක සංඛ්‍යාව තුළ විවිධ කාර්ය සහායක, සෞඛ්‍ය සේවක, ඡායා අනුපිටපත් යන්ත්‍ර ක්‍රියාකරු, මුළුතැන්ගේ සහායක යන තනතුරු ඇතුලත්ව නැත. එම තනතුරු හා තවත් තනතුරු කීපයක් වෙනුවට වැඩ සහායක තනතුර අලුතින් ඇති කරන ලදී. නමුත්, ඉහත තනතුරුවල එවකට සිටි සේවකයින් එම තනතුරු නාමයන් වලින්ම සිටින බැවින් ද ඔවුන් අතිරික්තයක් සේ පෙන්නුම් කරනු ඇත. එසේ වුවත් මෙම තනතුරු සඳහා බඳවා ගැනීම් සිදු කර නොමැති බව සඳහන් කරමි. වැඩ සහායක තනතුර සඳහා අනුමත සේවක සංඛ්‍යාව 2550 ක් වන අතර මෙම තනතුරට බඳවා ගැනීමේදී දැනට සිටින සේවක සංඛ්‍යාව සඳහා වැඩ සහායක, කම්කරු. ආම්පන්නකරු, විවිධ කාර්ය සහායක, සෞඛ්‍ය සේවක, මුළුතැන්ගේ සහායක හා ඡායා අනුපිටපත් යන්ත්‍ර ක්ර්යිකරු යන තනතුරුවල සිටින සේවක සංඛ්‍යාවන් ඇතුලත් කොට පුරප්පාඩු සංඛ්‍යාව තීරණය කොට බඳවා

| | | | |
|---|---|---|---|
| | | ගැනීම් සිදු කර ඇත. නමුත්, 2019.08.02 දින වැඩ සහායක තනතුරට 415 දෙනෙකු බඳවා ගෙන ඇති අතර එම අවස්ථාවේදී සිටින සේවක සංඛ්‍යාව සැලකීමේදී වැඩ සහායක යන තනතුරු නාමය යටතේ සිටි සංඛ්‍යාව පමණක් සලකා ඇති බව තහවුරු වේ. | |
| (ආ) | 2011 වර්ෂයේ දී ශ්‍රී ලංකා රේගුව දැනුවත් කිරීමකින් තොරව ආනයනය කරන ලද දොඹකර 27 ක් සම්බන්ධයෙන් රේගුව විසින් පනවා තිබූ රු.මිලියන 1,580 ක් වූ රේගු දණ්ඩනය ලිහිල් කර ගැනීම සඳහා රේගු ආඥා පනතේ 165 වගන්තිය ප්‍රකාරව රේගු විමර්ශණයක තීන්දුවක් මත මුදල් අමාත්‍යවරයා වෙත අභියාචනයක් සිදු කල හැකි වූවද, අධිකාරිය විසින් අමාත්‍යවරයා වෙත එවැනි අභියාචනයක් ඉදිරිපත් කර නොතිබුණි. කෙසේ වුවද, මේ සම්බන්ධයෙන් ගිණුම්වල රු.මිලියන 957.9 ක අසම්භාව්‍ය බැරකම් වෙන්කර තිබුණි. ඉහත කරුණ සම්බන්ධයෙන් අධිකාරිය අභියාචනාධිකරණයේ පවරන ලද නඩුව නිශ්ප්‍රභා කොට තිබූ අතර අභියාචනාධිකරණයේ නියෝගයට එරෙහිව 2018 වර්ෂයේ දී අධිකාරිය විසින් මෝසමක් ශ්‍රේෂ්ඨාධිකරණයේ ගොනු කර තිබුණි. | අධිකාරිය විසින් ශ්‍රේෂ්ඨාධිකරණයේ ගොනු කරන ලද අභියාචනය සඳහා අවසර ඉල්ලීමේ නඩු කටයුත්ත සමතයකට පත්කිරීම සම්බන්ධව විෂය භාර අමාත්‍යාංශය හා මුදල් අමාත්‍යාංශය මට්ටමෙන් සාකච්ඡා පැවැත්වීමෙන් අනතුරුව නඩුව සමතයකට පත් කිරීමට තීරණය කොට ඇත. එම කටයුත්ත සඳහා ඉදිරියේදී "ඒකාබද්ධ මෝසම් පතක්" අධිකරණය වෙත ඉදිරිපත් කිරීමට නියමිතව ඇත. | ආරවුල සාධාරණ පදනමකට හැකි ඉක්මනින් විසඳා ගැනීමට අවශ්‍ය සියලු පියවර ගත යුතු වීම. |
| (ඇ) | 2001 වර්ෂයේදි දකුණු ආසියා පිවිසුම් පර්යන්ත (South Asia Gateway Terminal Ltd-SAGT) සමාගම ආරම්භ කරන අවස්ථාවේදී ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් සමාගම වෙත ලබා දෙන ලද දොඹකර තුනක අගය හුවමාරු කරගැනීම සඳහා රු.මිලියන 141.63 ක වටිනාකමට එම සමාගමෙහි කොටස් අධිකාරිය වෙත ලබාදෙන බවට එකඟ වී තිබුණි. කෙසේ වුවද, සමාලෝචිත වර්ෂය අවසන් වන තෙක් අදාල කොටස් හිමිකම අධිකාරිය වෙත ලබා දී නොතිබූ අතර අදාල සමාගම විසින් කොටස් සඳහා ගෙවිය යුතු මුදලක් නොමැති බවට ශේෂ සනාථන මගින් පිළිතුරු ලබා දී තිබුණි. මේ සම්බන්ධයෙන් දකුණු ආසියා පිවිසුම් පර්යන්ත සමාගම සමග ගිවිසුම්ගත බැඳීමක් ඇති කරගෙන | හිමිකම ලැබී නොමැත යන්න සමග එකඟ වේ.සමාගමේ ඒකපාර්ශ්වික ක්‍රියාවෙන් ආරවුලක් හටගෙන ඇති බැවින් සමාගම හා වරාය අධිකාරිය විසින් එළඹ ඇති ප්‍රධාන ගිවිසුමේ සඳහන් ප්‍රතිපාදන අනුව එම ආරවුල විසඳා ගැනීමට පියවර ගත හැකිවේ. | අදාල සමාගම සමග සාකච්ඡා කර හිමිකම ලබා ගැනීම සඳහා අවසන් එකගතාවයකට පැමිණිය යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | නොතිබීම හේතුවෙන් අධිකාරිය වෙත අදාල සමාගමේ කොටස් ලැබීම අවිනිශ්චිත තත්ත්වයක පැවති අතර ,අධිකාරිය ඉහත ලැබිය යුතු කොටස් වටිනාකම සඳහා හානිකරණ වෙන්කිරීමක් ද සිදුකර නොතිබුණි. | | |
| (ඇ) | අධිකාරිය විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව, ශ්‍රී ලංකා වරාය අධිකාරිය සතු අක්කර 3 රූඩ් 2 හා පර්චර්ස් 14.24 ක් හා වර්ග මීටර් 56.99 පමණ වු භූමි ප්‍රමාණයක් සහිත ඉඩම් කට්ටි 15 ක් සඳහා අත්සන් කරන ලද කල්බදු ගිවිසුම් වල (Leasing Agreements) ගිවිසුම් ගත කාල පරිච්ඡේදයන් 2020 දෙසැම්බර් 31 දින වන විටත් අවසන් වී තිබුණි. එසේ වුවද, ගිවිසුම් යාවත්කාලීන කර ගැනීමට අවශ්‍ය කටයුතු අධිකාරිය විසින් සිදු කර නොතිබූ නිසා මේ සම්බන්ධයෙන් නීතිමය ගැටළු ඇති වීමේ අවදානම විගණනයේදී බැහැර කළ නොහැකි වේ. | ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් අත්සන් කර ඇති කල්බදු ගිවිසුම් වසර 01, වසර 02, වසර 05 ද ලෙස කෙටි කාලීන සහ වසර 30, වසර 35 ආදී වශයෙන් දිගු කාලීනව පවතී. මෙම සෑම ගිවිසුමක්ම අවසන් වීමට අඩුම තරමින් මාස 03 කට පෙර නැවත ගිවිසුම් අළුත් කිරීම සඳහා අවශ්‍ය කටයුතු ආරම්භ කර ඇත. එසේම අපගේ කොන්දේසි පිළිබඳ බදුකරුගේ එකඟතාවය ලබාගැනීමට සැලකිය යුතු කාලයක් ගතවන බව අවධාරණය කරමි.<br>යම් යම් පරිපාලනමය හේතූන් නිසා අවශ්‍ය අනුමැතිය ප්‍රමාදවන අවස්ථාවලදී හැර සෑම අවස්ථාවකම නියමිත කාලය තුල ගිවිසුම අළුත් කිරීමට උත්සහ කර ඇත.<br>තවදුරටත් මෙකී කටයුතු කඩිනම් කිරීමේ පියවරක් ලෙස ගිවිසුම් අවසන්වීමට මාස 06 කට හෝ ඊට පෙර නව ගිවිසුම්වල කටයුතු ආරම්භ කිරීමට නියමිතය. කෙසේ නමුත් මේ නිසා නීතිමය ගැටළු ඇතිවීමේ අවදානමක් මෙතෙක් පැන නැඟී නොමැත. | කල්බදු ගිවිසුම් යාවත්කාලීනව පවත්වාගෙන යාම අධිකාරියේ වගකීමක් වන බව. |
| (ඉ) | පිඹුරුපත් අංක සීඕ/සීඕඑල්/2012/1047 දරණ කොළඹ ඩී.ආර්. විජේවර්ධන මාවතේ පිහිටි ඉඩම් අක්කර 2 රූඩ් 3 පර්චස් 9.61 ක් වූ ඉඩම නෙළුම් කුළුණ ඉදිකිරීම සඳහා නාගරික සංවර්ධන අධිකාරිය වෙත භුක්තිය භාර දී තිබුණද විධිමත් ක්‍රියාමාර්ග අනුව වටිනාකම පොත්වලින් ඉවත්කර, හිමිකම ඔප්පුවක් මගින් ඉඩම පවරා දී නොතිබුණි. | වරාය අධිකාරියට අයත් කොළඹ 10, ඩී. ආර්. විජේවර්ධන මාවතේ නෙළුම් කුළුණ ඉදිකර ඇති භූමිය ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 38 (ආ) වගන්තිය අනුව නාගරික සංවර්ධන අධිකාරිය විසින් භුක්තිය භාරගෙන ඇති නමුත් වන්දි පරීක්ෂණයේ තීරණය ලබා දී නොමැත. ඉඩමේ වන්දි ලබාදීම පිළිබඳ තීරණය කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් විසින් 2020.08.19 දින අපවෙත දැනුම් දී ඇත. එබැවින් ඉඩම් අත්පත් කිරීමේ කටයුතු අවසන් වී නොමැති බැවින් හිමිකම් ඔප්පුවක් මගින් ඉඩම් පවරා | විධිමත් පරිදි ඉඩම් පවරා දීමේ කටයුතු සිදුකර අදාල වත්කම පොත්වලින් ඉවත් කිරීමට කිරීම. |

| | | | |
|---|---|---|---|
| | | නොමැත. එතෙක් මෙම ඉඩමේ නීත්‍යානුකූල අයිතිය වරාය අධිකාරිය සතු වේ.<br>අදාළ වන්දි මුදල ලැබී සියළු නීතිමය කටයුතු අවසන්වීමෙන් අනතුරුව හිමිකම් ඔප්පුවක් මගින් පැවරීම සිදුකළ යුතුව ඇත. | |
| (ඊ) | පිඹුරුපත් අංක එල්/එස්/එම්අයිඑස්/344 දරණ කොළඹ 01 කෙලින් වීදියට හා ඕල්කට් මාවතට මායිම් වන අක්කර 02 ක ඉඩම රේගු දෙපාර්තමේන්තුවට ගොඩනැගිල්ලක් ඉදි කිරීම සඳහා ලබාදී තිබූ නමුත් ඉඩම තක්සේරු කර නීත්‍යානුකූලව පවරා දීමට හා වටිනාකම පොත්වලින් ඉවත්කිරීමට 2021 අප්‍රේල් 30 දින දක්වාම කටයුතු කර නොතිබුණි. | රේගු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය ඉදිකිරීම සඳහා ලබාදෙන ලද ශ්‍රී ලංකා වරාය අධිකාරියට අයත් අක්කර 2 ක ඉඩම පැවරීමේ කටයුතු අයකර ගත යුතු මුදල හා ඊට පෙර භාවිතා කර ඇති වෙනත් ඉඩම් සම්බන්ධයෙන් දෙපාර්ශවය අතර ගැටළුකාරී තත්ත්වයක් පැන නැගුණි. රාජ්‍ය ආයතන අතර පවතින ගැටළු සාකච්ඡා මාර්ගයෙන් විසඳීම වඩාත් සුදුසු බවට තීරණය වී ඇත. ඒ අනුව මේ පිළිබඳව ඉදිරියේදී සාකච්ඡා කර තීරණයකට එළඹීමට යෝජිතය. | විධිමත් ක්‍රමවේද අනුව ඉඩම් පවරා දීමේ කටයුතු සිදුකර අදාල වත්කම පොත්වලින් ඉවත් කිරීම. |
| (උ) | දක්ෂිණ ප්‍රදේශ සංවර්ධනය කිරීමේ අරමුණින් ගාල්ල වරායේ බහු කාර්ය පර්යන්තයක් ඉදිකිරීම, 2006 මාර්තු 28 වන දින ශ්‍රී ලංකා රජය හා අන්තර්ජාතික සහයෝගීතාවය සඳහා වූ ජපාන බැංකුව (JBIC) අතර ඇති කර ගන්නා ලද ණය ගිවිසුමක් යටතේ ක්‍රියාත්මක කිරීමට එකඟව තිබුණද ලෝක උරුමයක් ලෙස නම්කර ඇති ගාලු කොටුව ආශ්‍රිතව මෙම ඉදිකිරීම් සිදු කිරීම සඳහා යුනෙස්කෝ (UNESCO) සංවිධානයේ අනුමැතිය ලබාගත යුතුව තිබුණි. ඒ සඳහා වසර 3 කට අධික කාලයක් ගතවීම හේතුවෙන් ණය ප්‍රදානකරු විසින් ණය කාලසීමාව දීර්ඝ නොකිරීම නිසා මෙම ව්‍යාපෘතිය අත්හිටුවීමට තීරණය කර තිබුණි. මේ අනුව මේ සඳහා වැය කරන ලද රු. මිලියන 418 ක් වූ උපදේශන ගාස්තු අනාර්ථික වියදමක් වී තිබුණි. උපදේශන ගාස්තු ලෙස ගෙවන ලද මුදල අධිකාරියේ 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුල කෙරීගෙනයන වැඩ යටතේ දක්වා තිබුණි. | ගාල්ල වරායේ දියකඩනයක් හා බහුකාර්ය පර්යන්තයක් ඉදිකිරීම සඳහා ඇති කරගන්නා ලද SLP-85 ණය ගිවිසුම යටතේ යෙන් මිලියන 14,495 ක් ශ්‍රී ලංකා රජය වෙත ලබා දීමට එකඟ වී තිබුණි. 2016 මාර්තු මාසයේදී ශ්‍රී ලංකා රජයේ ඉල්ලීම පරිදි මෙම ණය ගිවිසුම 2017 ජුලි දක්වා අන්තර්ජාතික සහයෝගිතාවය සඳහා වූ ජපාන බැංකුව (JBIC) මගින් දීර්ඝ කරන ලදී.<br>ශ්‍රී ලංකා වරාය අධිකාරිය, ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශය හා එක්ව මෙම ව්‍යාපෘතිය සඳහා UNESCO අනුමැතිය ඉල්ලීම් කර මේ සඳහා වන කොන්දේසිගත අනුමැතිය 2016 දී ලබා ගන්නා ලදී.<br>මෙම ණය මුදල යටතේ ඉදිකල හැක්කේ දියකඩනය පමණක් බැවින් මෙම ව්‍යාපෘතිය වර්තමානයේ ක්‍රියාත්මක කළත් අපේක්ෂිත ප්‍රතිලාභ රටට නොලැබෙන නිසා රජය මගින් මෙම ව්‍යාපෘතිය 2017 වසරේදී අත්හිටුවීමට තීරණය කරන ලදී.<br>මෙම ව්‍යාපෘතිය නැවත ආරම්භ කරන්නේ නම් ව්‍යාපෘතියේ නිර්මාණ | අපේක්ෂිත පරිදි හැකි ඉක්මණින් ඉදිකිරීම තුලින් අනාර්ථික වියදම් අවම කර ගත හැකිය. |

| | | | |
|---|---|---|---|
| | | සැළසුම් භාවිතා කළ හැකි වන නිසා එම නිර්මාණ සැළසුම් සැකසීම සඳහා උපදේශන ගාස්තු වශයෙන් වැය කරන ලද ජපන් යෙන් මිලියන 418 අනාර්ථික වියදමක් නොවනු ඇත. | |
| (ඖ) | හම්බන්තොට වරාය ව්‍යාපෘතිය සඳහා ඉඩම් අත්පත් කරගැනීම වෙනුවෙන් ඉඩම් අහිමිවූවන්ට වන්දි ගෙවීම සඳහා 2015 සහ 2016 වර්ෂයන්හිදී රු.මිලියන 108.77 ක මුදලක් හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ද ක්ෂේත්‍ර රාජකාරී වෙනුවෙන් හා ඉඩම් එළිපෙහෙලි කිරීමට අදාලව 2014 වර්ෂයේදී රු.මිලියන 4. 39ක් වැයකර තිබුණි.2021 අප්‍රේල් 30 දින වන විටත් අදාල වන්දි ගෙවීම් පිළිබඳ වාර්තාවක් ශ්‍රී ලංකා වරාය අධිකාරිය වෙත ඉදිරිපත්කර නොතිබූ අතර වැය කරන ලද මුදල් දේපළ, පිරියත හා උපකරණ යටතේ වූ ඉඩම් නිෂ්කාෂණ ගිණුමේ ඇතුළත් කර තිබුණි. | එකඟ වේ.<br>හම්බන්තොට ඉඩම් අත්පත් කර ගැනීම අදියර-2 යටතේ අදාල වන්දි ලබා දුන් ඉඩම් වල අයිතිය ශ්‍රී ලංකා වරාය අධිකාරිය වෙත පැවරීම මෙතෙක් සම්පූර්ණ කර නොමැති අතර පැවරීමට අදළ කටයුතු හම්බන්තොට ප්‍රාදේශී ලේකම් කාර්යාලය මගින් මේ වන විට සිදුකර ගෙන යමින් පවතී. එම ඉඩම්වල පැවරීමේ කටයුතු අවසන් වූ පසු අදාළ වාර්තාව අධිකාරිය වෙත ලබාදීමට නියමිතය. | වන්දි ගෙවීම් පිළිබඳ වාර්තාව ලබාගෙන අදාල වියදම ඉඩම් නිෂ්කාශන ගිණුමෙන් ආයෝජන දේපළ ගිණුමට ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කල යුතුය. |
| (ක) | 2019 දෙසැම්බර් 04 වන දින නෞකාවක් කොළඹ වරායේ ජය බහාලුම් පර්යන්තයෙහි ගැටීම නිසා සිදුවූ අනතුර හේතුවෙන් ජය බහාලුම් පර්යන්තයේ ජල වාරකය (Caisson), වේග වළක්වනය (Fenders), වරාය වේදිකා බිත්තිය (Quay wall) යනාදියට හානි සිදුවී තිබුණි. එම හානිය රු මිලියන 315.90 ක් ලෙස ඇස්තමේන්තු කර තිබුණි. එසේම ඉහත හානිය වෙනුවෙන් රු.මිලියන 384.42 ක මුදලක් 2019 දෙසැම්බර් 30 දින අධිකාරිය වෙත ලැබී තිබුණ ද මෙතෙක් අළුත්වැඩියා කිරීමේ කටයුතු සිදුකර නොතිබුණි.<br>තවද, වත්කම් වලට සිදුවූ හානි වෙනුවෙන් 2020 දෙසැම්බර් 31 දිනට වසර 5 කට වැඩි කාලයක් තිස්සේ වරාය අලාභ ලැබීම් ගිණුමේ පවතින රු.මිලියන 486.85 ක ශේෂය සඳහා අදාළ තොරතුරු විගණනය සඳහා ඉදිරිපත් නොවුණි. | එකඟ වේ.<br>හානියට අදාල අළුත්වැඩියා කටයුතු සිදු කිරීම සඳහා අවශ්‍ය යන්ත්‍ර උපකරණ පහසුකම් අප සතුව නොමැත. එබැවින් එය සිදු කල යුතුව ඇත්තේ බාහිර කොන්ත්‍රාත්කරුවකු සම්බන්ධ කිරීම මගිනි. තවද ඒ සඳහා ජය බහළු පර්යන්තයේ අදාල කොටසෙහි මෙහෙයුම් කටයුතු සිදුකිරීම් තාවකාලිකව නතර කිරීමට සිදුවේ. රටතුල පවතින ''කොවිඩ් - 19'' වසංගත තත්ත්වය හේතුවෙන් අළුත්වැඩියා කටයුතු සිදුකිරීමේ ක්‍රියාවලිය මෙතෙක් ආරම්භ කර නොමැත.<br>ඒ අනුව ඉදිරියේදී ගැලපීම් සිදු කිරීමට කටයුතු කරනු ලැබේ. | සුදුසු පරිදි අදාල අළුත්වැඩියා කටයුතු සිදු කිරීමට ක්‍රියා කල යුතු බව. |

## 3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| කොළඹ වරායේ දැනට බහාළුම් හැසිරවීම සඳහා ක්‍රියාත්මක පර්යන්ත අතුරින් ගැඹුර (Draft) මීටර් 14.25 ට වඩා වැඩි නැව් පැමිණිය හැකි එකම පර්යන්තය, කොළඹ ජාත්‍යන්තර බහාළුම් පර්යන්තය (C.I.C.T) පමණක් වන අතර එහි ධාරිතාවය වසරකට විසිසම ඒකක මිලියන 2.4 ක් වේ. 2020 වර්ෂයේ දී එම පර්යන්තය වෙත ගැඹුර මීටර් 14.25 ට වැඩි නැව් 401 ක් පැමිණ තිබු අතර මුළු බහාළුම් ඒකක මිලියන 2.8 කට වැඩි සංඛ්‍යාවක් මෙහෙයවා තිබුණි. එය උපරිම ධාරිතාවයද ඉක්මවා ගොස් තිබූ තත්ත්වයක් බව නිරීක්ෂණය විය. 2011 වර්ෂයේදී ස්කොට් හා විල්සන් සමාගම විසින් සිදුකර තිබූ අධ්‍යනයක් අනුව 2015 වර්ෂය වන විට කොළඹ වරායේ පවත්නා පර්යන්ත ධාරිතාවය උපරිමයට ලඟා වන බවත් ඒ වන විට ඇතිවන ඉල්ලුමට මුහුණ දීම සඳහා නැගෙනහිර බහාළුම් පර්යන්තය ක්‍රියාකාරී තත්ත්වයට පත් කළ යුතු වන බවත් පෙන්වා දී තිබුණි.<br><br>මේ අතර කොළඹ වරාය පුළුල් කිරීමේ ව්‍යාපෘතියට අදාළව ලංකා බැංකුවෙන් අරමුදල් සම්පාදිතව බහාළුම් ඒකක 800,000 ක වාර්ෂික ධාරිතාවයක් සහිත ඉදිකිරීම් පිරිවැය රු.මිලියන 11,168 ක් වූ මීටර් 18 ක ගැඹුරැති හා මීටර් 440 ක් දිගැති නැගෙනහිර බහාළුම් පර්යන්තයේ අදියර 1 හි ඉදිකිරීම් කටයුතු 2016 අප්‍රේල් මාසයේ අවසන් කර තිබුණි. අමාත්‍ය මණ්ඩල තීරණයක් අනුව ජය බහලු පර්යන්තය සඳහා මිලදීගත් නෞකාවේ සිට ගොඩබිම දක්වා මෙහෙයුම් කටයුතු සිදුකළ හැකි දොඹකර තුනක්, 2020 පෙබරවාරි 07 දිනැති අංක PA/HD/25 දරණ අධ්‍යක්ෂ මණ්ඩල තීරණය පරිදි නැගෙනහිර බහලුම් පර්යන්තයේ (ECT) සවි කර, එහි මෙහෙයුම් කටයුතු ආරම්භකර තිබුණි. පසුව ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ද ලබාගෙන තිබුණි. අනතුරුව, 2021 | එකඟ නොවේ.<br>ජය බහළු පර්යන්තය සඳහා නෞකාවේ සිට ගොඩබිම දක්වා මෙහෙයුම් කටයුතු සිදුකළ හැකි (Gantry Crane) දොඹකර තුන (117, 118, 119) නැගෙනහිර බහළු පර්යන්තයේ (ECT) සවිකර මෙහෙයුම් කටයුතු 2020 ඔක්තෝම්බර් මාසයේ සිට ආරම්භ කර ඇත. එය පහත සංඛ්‍යා ලේඛන මගින් පැහැදිලි වේ.<br>බහළු නෞකා පැමිණීම සහ බහළු මෙහෙයුම් ප්‍රමාණය - නැගෙනහිර බහළු පර්යන්තය - 2020 (වගුව පහත)<br><br>බහළු නෞකා පැමිණීම සහ බහළු මෙහෙයුම් ප්‍රමාණය - නැගෙනහිර බහළු පර්යන්තය - 2021 (වගුව පහත) | පර්යන්තයේ මෙහෙයුම් ධාරිතාවය උපරිම ලෙස උපයෝජනය කිරීම සඳහා අත්‍යාවශ්‍ය වන නෞකාවේ සිට ගොඩබිම දක්වා මෙහෙයුම් කටයුතු සිදුකළ හැකි විශාල පරිමාණයේ දොඹකර සපයාගෙන මෙහෙයුම් කටයුතුවල කාර්යක්ෂමතාවය වර්ධනය කරගත යුතු බව. |

බහළු නෞකා පැමිණීම සහ බහළු මෙහෙයුම් ප්‍රමාණය - නැගෙනහිර බහළු පර්යන්තය - 2020

| මාසය | බහළු නෞකා සංඛ්‍යාව | බහළු මෙහෙයුම් ප්‍රමාණය (විස්ස සම ඒකක) |
| --- | --- | --- |
| ඔක්තෝම්බර් | 03 | 2,744 |
| නොවැම්බර් | 11 | 15,743 |
| දෙසැම්බර් | 12 | 23,254 |
| **එකතුව** | **26** | **41,741** |

බහළු නෞකා පැමිණීම සහ බහළු මෙහෙයුම් ප්‍රමාණය - නැගෙනහිර බහළු පර්යන්තය - 2021

| මාසය | බහළු නෞකා සංඛ්‍යාව | බහළු මෙහෙයුම් ප්‍රමාණය (විස්ස සම ඒකක) |
| --- | --- | --- |
| ජනවාරි | 17 | 34,874 |
| පෙබරවාරි | 09 | 32,181 |
| මාර්තු | 15 | 33.174 |
| අප්‍රේල් | 16 | 41,264 |
| **එකතුව** | **57** | **141,493** |

පෙබරවාරි 09 දිනැති අංක: අමප/21/0198/328/005/ටීබීආර් දරණ අමාත්‍ය මණ්ඩල තීරණය මගින් නැගෙනහිර බහලුම් පර්යන්තය සංවර්ධනය කිරීම, මෙහෙයුම් උපකරණ මිලදීගැනීමට සහ ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සම්පූර්ණ හිමිකාරිත්ව සහිත බහාළුම් පර්යන්තයක් ලෙස මෙහෙයුම් කටයුතු සිදු කිරීමට අනුමතිය ලබාදී තිබුණි. විගණනය වෙත ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව 2020 සැප්තැම්බර් සිට දෙසැම්බර් දක්වා කාලය තුළදී බහාළුම් නැව් 26 පර්යන්තය වෙත පැමිණ තිබූ අතර බහාළුම් 41,741ක් මෙහෙයවා තිබුණි. කෙසේ වුවද, පර්යන්තයේ මෙහෙයුම් ධාරිතාවය උපරිම ලෙස උපයෝජනය කිරීම සඳහා අවශ්‍ය වන නෞකාවේ සිට ගොඩබිම දක්වා මෙහෙයුම් කටයුතු සිදුකළ හැකි විශාල පරිමාණයේ දොඹකර සපයා ගත යුතු බව නිරීක්ෂණය විය.